*සැ. යු.*- 2010.10.15 දින පළ වූ අංක 1,676 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2010 වර්ෂය සඳහා බලපිටිය අධිකරණ කලාපයට අයත් සාමාන්‍ය ජූරි සභිකයින්ගේ හා විශේෂ ජූරි සභිකයින්ගේ නාමාවලියක් (සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයට පමණක් අයත්) මෙම ගැසට් අංකය හා එයට අදාල පළකරන දිනය යටතේ පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,677 - 2010 ඔක්තෝබර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2010.10.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1656 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1226 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 29 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාතේ පළාත් සභාවේ යෝජිත ග්‍රාම සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත

මධ්‍යම පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10 ක් ඉක්මවා ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා මධ්‍යම පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10 තුළදී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතුය.

අමාත්‍ය අනුෂ්‍යා සිවරාජා,<br>
කර්මාන්ත, ක්‍රීඩා, වනිතා කටයුතු, ග්‍රාම සංවර්ධන,<br>
වතු යටිතල පහසුකම් සංවර්ධන,<br>
හින්දු සංස්කෘතික තරුණ කටයුතු හා<br>
අධ්‍යාපන (දෙමළ) අමාත්‍යාංශය.

තැ. පෙ. 41,<br>
ගැටඹේ,<br>
පේරාදෙණිය.

### මධ්‍යම පළාත් සභාවේ 2010 අංක - දරන

### ග්‍රාම සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ නව වැනි උපලේඛනයේ 1 වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) අංක 10 යටතේ බලය පවරන ලද ග්‍රාම සංවර්ධන විෂයට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පළාත සඳහා ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම, මධ්‍යම පළාත තුළ ග්‍රාම සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම, හා පවත්වාගෙන යාම, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් බල මණ්ඩල, පළාත් බල මණ්ඩල පිහිටුවීම ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම, කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විධි විධාන සැලැස්වීමද, ඇතුලත් මධ්‍යම පළාතේ ග්‍රාම සංවර්ධනය හා ඊට සම්බන්ධ ආනුෂාංගික කරුණු සඳහා විධි විධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ*

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාත් සභාවේ 2010 අංක....................................... දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වේ.

#### 1 කොටස

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම.

1. මධ්‍යම පළාත තුළ ග්‍රාම සංවර්ධන විෂයට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතු ය.

මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ.

2. (i) මෙම ප්‍රඥප්තියේ හඳුන්වනු ලබන අරමුණු ඉටුකර ගැනීම සඳහා මධ්‍යම පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂවරයෙකු පත් කල යුතු වන්නේය. එම තැනැත්තා දෙපාර්තමේන්තු ප්‍රධානියා විය යුතු ය. මොහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු විය යුතු ය.

(ii) පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා පත්කිරීම මධ්‍යම පළාත් සභාවේ සාමාන්‍ය බඳවා ගැනීමේ හා පත්කිරීමේ පරිපාටීන්ට අනුකූලව හා ඒ සඳහා බලය හිමි පත්කිරීම් බලධාරියා විසින් සිදු කිරීමට යටත් වේ.

දෙපාර්තමේන්තුව සඳහා අනෙකුත් නිලධාරීන් පත් කිරීම හා බලතල හා යුතුකම් පැවරීම.

03. මෙම ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීමට ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂකට සහය වීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් නිලධාරීන් හා කාර්ය මණ්ඩල පත් කළ යුතුය. පළාත් අධ්‍යක්ෂවරයාගේ වගකීම් යුතුකම් හා බලතල එම නිලධාරීන්ට පැවරිය හැක.

## II කොටස

## අරමුණු හා කාර්යයන්

04. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යයන් සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය යැයි හැඟෙන සියලු කටයුතු ඉටු කිරීමටත් ඒ සඳහා අවශ්‍ය විධි විධාන සැලසීම සඳහාත් පහත සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යයන් වන්නේය.

දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යයන්.

(i) ග්‍රාමීය ජනතාවගේ සමාජ, ආර්ථික, සංස්කෘතික, කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා හඳුනාගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ii) ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල, ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩල පිහිටුවීම, සංවිධානය කිරීම. ලියාපදිංචි කිරීම හා ව්‍යවස්ථානුකූලව පවත්වාගෙන යාම.

(iii) ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම.

(iv) පළාත් සභාවේ අනුමැතිය ඇතිව අවශ්‍ය අවස්ථාවල දී ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා අරමුදල් ගොඩනැගීම.

(v) ප්‍රජා ව්‍යාපෘති සඳහා ග්‍රාමීය නායකත්වය සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම.

## III කොටස

## ග්‍රාම සංවර්ධන සමිති හා බල මණ්ඩල

05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පිහිටි සියලුම ග්‍රාම සංවර්ධන සමිති ඒකාබද්ධතාවයෙන් මධ්‍යම පලාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම එක බැගින් ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක් සැකසේ. දිස්ත්‍රික්කයක පිහිටි සියලුම ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලවල ඒකාබද්ධතාවයෙන් හා එම දිස්ත්‍රික්කයේ සියලුම ග්‍රාම සංවර්ධන සමිති නියෝජනයෙන් ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල සැකසේ. මහනුවර මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික් බල මණ්ඩල ඒකාබද්ධතාවයෙන් හා මධ්‍යම පළාත තුළ සියලුම ග්‍රාම සංවර්ධන සමිති නියෝජනයෙන් මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන බල මණ්ඩල සැකසේ. මෙම ප්‍රඥප්තිය අනුව පිහිටවනු ලබන ග්‍රාම සංවර්ධන සමිතිවලට, ප්‍රාදේශීය බල මණ්ඩලවලට, දිස්ත්‍රික් බල මණ්ඩලවලට, පළාත් බල මණ්ඩලවලට, පිළිවෙලින් ව්‍යවස්ථා හතරක් තිබිය යුතුය. එම ව්‍යවස්ථා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් සකස් කොට මධ්‍යම පළාත් ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව ක්‍රියාවට නැංවිය යුතුය.

ග්‍රාම සංවර්ධන සමිති හා බල මණ්ඩල ව්‍යවස්ථාව.

06. සමිති හා බල මණ්ඩලවල බල ප්‍රදේශ කාර්ය භාරය හා අනෙකුත් සියලු කටයුතු අදාළ ව්‍යවස්ථාව අනුව සිදු කල යුතුය.

07. ග්‍රාම සංවර්ධන සමිති හා ප්‍රාදේශීය බල මණ්ඩල ලියාපදිංචි කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් වෙතද, දිස්ත්‍රික් බල මණ්ඩල හා පළාත් බල මණ්ඩල ලියාපදිංචි කිරීමේ බලය ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙතද පැවරේ.

සමිති ලියාපදිංචි කිරීම.

08. අදාළ ව්‍යවස්ථාවලට පටහැනිව ක්‍රියා කරන බවට චෝදනා ලැබ පවත්වන විධිමත් පරීක්ෂණයකින් වැරදිකරුවන් වන හෝ ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට තහවුරු වන කවර හෝ අවස්ථාවක, එම සමිති හෝ ප්‍රාදේශීය බල මණ්ඩල විසුරුවා හැරීමේ බලය අදාළ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් සතුවේ. දිස්ත්‍රික් හා පළාත් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලය විසුරුවා හැරීමේ බලය පළාත් අමාත්‍යාංශයේ ලේකම් සතු වන්නේය.

අනුමත සමිති හා බල මණ්ඩල ව්‍යවස්ථාවලට පටහැනිව කටයුතු කිරීම.

(i) ඉහත කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්ගේ තීරණයට එරෙහිව යම් සමිතියකට දින 14 ක් ඇතුළත අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. ලේකම්වරයා දින 30 ක් ඇතුලත තම තීන්දුව දිය යුතු අතර ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

(ii) ඉහත සඳහන් ලෙස නිලධාරි මණ්ඩලය විසුරුවා හරින ලද සමිතිය හෝ බල මණ්ඩලය ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ නැවත ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමේ බලය පිළිවෙලින් ග්‍රාම සංවර්ධන සමිතියක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක් නම් ප්‍රාදේශීය ලේකම්ටද දිස්ත්‍රික් හෝ පළාත් බල මණ්ඩලයක් නම් අමාත්‍යාංශ ලේකම් ද සතු වන්නේය.

09. (i) සමිතියක හෝ බල මණ්ඩලයක මුදල් හෝ දේපළ අඩුවක් සිදු වූ විට අධ්‍යක්ෂවරයා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා එම මුදල් හෝ දේපළේ වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

සමිති හා බල මණ්ඩලවල සිදුවන වංචාවන් සම්බන්ධ ක්‍රියා පිළිවෙත්.

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ සිදුවූ මුදල් හෝ දේපළ වංචාවක් පිළිබඳව අධිකරණයට යෑමට ප්‍රාදේශීය ලේකම්ට/පළාත් අධ්‍යක්ෂකට/අමාත්‍යාංශ ලේකම්ට බලය පැවරේ.

(iii) ග්‍රාම සංවර්ධන සමිතියක, ප්‍රාදේශීය බල මණ්ඩලයක, දිස්ත්‍රික් බල මණ්ඩලයක දරන පදවියකින් ඉවත් වුව ද සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හට තමන් ධූරය දැරූ කාලය තුළදී සිදුවූ මුදල් හා දේපළවල වංචාවන් හෝ දූෂණ සම්බන්ධව වගකිව යුතුය. එම පදවිය දැරූ අයෙකු හදිසියේ මියගියහොත් ඔහුගේ දේපළට හිමිකම් කියන අයගෙන් අදාළ අලාභය අයකරගත හැකි වන්නේය.

## IV කොටස

### පොදු විධි විධාන

ප්‍රඥප්තියට අදාළ රෙගුලාසි පැනවීම

10. ප්‍රඥප්තියේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විධි විධාන ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි විටින් විට අවශ්‍ය වන රෙගුලාසි පැනවීමට විෂයභාර අමාත්‍යතුමාට බලය ඇත.

රෙගුලාසි බලාත්මක වීම

11. ඉහත 10 වගන්තිය යටතේ පනවනු ලබන සෑම රෙගුලාසියක්ම අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන නියමිත දිනයක සිට බලාත්මක විය යුතුය.

සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

12. මෙම ප්‍රඥප්තියේ සිංහල පාඨය, දෙමළ පාඨය, හා ඉංග්‍රීසි පාඨය අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල පාඨයේ අදහස බලාත්මක වන්නේය.

## V කොටස

### අර්ථ නිරූපනය

අර්ථ නිරූපනය

13 . (i) ආණ්ඩුකාරවරයා යනුවෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා ය.

(ii) අමාත්‍යවරයා - යනුවෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා ය.

(iii) අමාත්‍යාංශ ලේකම් - යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ය.

(iv) පළාත් අධ්‍යක්ෂක යනුවෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙක්ය.

(v) ප්‍රාදේශීය ලේකම් - යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් භාරව ක්‍රියාකරන ප්‍රාදේශීය ලේකම්වරයෙකු හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙක්ය.

(vi) සමිති - මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක වන ග්‍රාම සංවර්ධන සමිති ය.

(vii) බල මණ්ඩල- මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක වන ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල හා ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩල.

(viii) දේපළ - යන්නෙන් අදහස් වන්නේ ග්‍රාම සංවර්ධන සමිති හෝ ග්‍රාම සංවර්ධන බල මණ්ඩලය සතු පොත් පත් ලේඛන අත ඉතිරි හා බැංකුගත මුදල්, ලී බඩු උපකරණ, ගොඩනැගිලි හා ඉඩකඩම් ව්‍යාපෘති හා චංචල නිශ්චල යන සියලුම දේපළය.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාතේ පළාත් සභාවේ සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්ති කෙටුම්පත

ඌව පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පල කරමි.

මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවීමෙන් පසු දින 10ක් ඉක්මගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා ඌව පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10ක් තුළදී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතුය.

අමාත්‍ය ආර්. එම්. කුමාරසිරි රත්නායක,
මාර්ග සංවර්ධන, නිවාස, ජලසම්පාදන,
පාරිභෝගික කටයුතු හා සමූපකාර සහ
ආහාර සැපයීම් සහ බෙදාහැරීම්
අමාත්‍යාංශය,
ඌව පළාතේ පළාත් සභාව.

2010 ඔක්තෝබර් මස 05 වැනි දින,
බදුල්ල,
ආර්. එච්. ගුණවර්ධන මාවත, අංක 301 හි
අමාත්‍ය කාර්යාලයේ දී ය.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව**

**ඌව පළාතේ පළාත් සභාවේ යෝජිත සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්ති කෙටුම්පත**

***ඌව පළාත තුළ වෙසෙන ජනතාවට සාධාරණ සහ යුක්ති සහගත සමූපකාර සේවාවක් ලබාදීම ඌව පළාත් සභාවේ වගකීම වන බැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන සංශෝධනය මගින් පළාත් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාත තුළ කාර්යක්ෂම හා ඵලදායී සමූපකාර ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමේ අරමුණ ඇතිව සමූපකාර ව්‍යාපාරයේ නියැලී සිටින සේවකයින් සහ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, සේවයෙන් පහ කිරීම, විනය පාලනය කිරීම, වැටුප් හා දීමනා ගෙවීම, පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය නෛතික ක්‍රියා පිළිවෙලක් ඇති කිරීම සඳහාත් ඊට ආනුශංගික වූ කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනතට සහ එයට සිදු කරන ලද සංශෝධන වලට අනනුකූල වේ.***

කාර්යක්ෂම ඵලදායි හා විශ්වාසනීය වූ යහපත් සමූපකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යාම තුළින් ඌව පළාතේ ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධනය ඉහල නැන්වීමට ඌව පළාත් සභාව බැඳී සිටින හෙයින් ; පූර්විකාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. මෙම ප්‍රඥප්තිය මෙහි මින් මතු ''ආණ්ඩුකාරවරයා'' ලෙස හඳුන්වනු ලබන ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ, අනුමැතිය ලැබුනු දිනක සිට හෝ ආණ්ඩුකාරවරයා විසින් නියම කරන ලද දිනක සිට වලංගු වන්නේය. ක්‍රියාත්මක වන දිනය

1 කොටස

**ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව සංස්ථාපනය, එහි බලතල හා කාර්යයන්**

3. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා මින් මතුවට ''කොමිෂන් සභාව'' යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවනු ලැබේ. ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව සංස්ථාපනය

4. කොමිෂන් සභාව අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත සංස්ථාවක් විය යුතු අතර, එහි නෛතික සංස්ථාගත තත්ත්වයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පැවරීම හා නඩු පවරනු ලැබීමට හැකි විය යුතු අතර මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය සියලු දේ කිරීමට ද, බලය ඇති නීතිගත සංස්ථාවක් විය යුතුය. නීතිගත සංස්ථාවක් විය යුතු බව

කොමිෂන් සභාවේ සංයුතිය

5. (1) කොමිෂන් සභාව මෙහි මින් මතු ''අමාත්‍යවරයා'' ලෙස හඳුන්වනු ලබන ඌව පළාත් සමූපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තිදෙනෙකු ගෙන් සමන්විත විය යුතුය.

(2) යම් තැනැත්තෙකු :-

(අ) සමූපකාර සමිති සේවකයකු හෝ හිටපු සේවකයකු වේ නම් ; හෝ

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව සමූපකාර සේවකයින්ගේ වැටුප්, වේතන හෝ සේවා කොන්දේසි සකස් කිරීමේ අරමුණ වශයෙන් පවත්වාගෙනයනු ලබන සේවක වෘත්තීය සමිතියක සාමාජිකයෙකුව සිටින තැනැත්තෙකු වේ නම් ; හෝ

(ඇ) සමූපකාර සමිති නීතිය අනුව සමූපකාර සමිතියක දැනට ධුරය දරන නිලධාරියෙකු හෝ ධුරය දැරූ නිලධාරියෙකු වන යම් තැනැත්තෙකු වේ නම් ; හෝ

(ඈ) සිහි විකල් තැනැත්තෙකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තෙකු හෝ දණ්ඩ නීති සංග්‍රහය යටතේ නැතහොත් අල්ලස් පනත යටතේ වරදකරුවෙකු බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබ සිටින අයෙකු වේ නම් ; හෝ

(ඉ) තත් කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයෙකු හෝ වශයෙන් ධුර දරන තැනැත්තෙකු වේ නම්, හෝ

(ඊ) සමූපකාර සමිතියක හා සමූපකාර සේවකයෙකු වෙනුවෙන් නීති කටයුතු සම්බන්ධව පෙනී සිටි හෝ පෙනී සිටින නීති නියෝජිතයෙකු හෝ විනය පරීක්ෂණ නිලධාරියෙකු හෝ අභියාචනා පරීක්ෂණ නිලධාරියෙකු වේ නම් ; හෝ

(උ) සමූපකාර විෂය හා සම්බන්ධ අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ සේවය කරන අයෙකු වේ නම්; හෝ

ඒ තැනැත්තා එකී කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ තව දුරටත් එහි කටයුතු කිරීමට හෝ නුසුදුස්සෙකු විය යුතුය.

(3) සමූපකාර සේවක කොමිෂන් සභාවට පත් කරනු ලබන සාමාජිකයන් අතරින් දෙදෙනකු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ මාණ්ඩලික මට්ටමේ තනතුරු දැරූ නිලධාරීන් විය යුතුය. එසේම එක් අයෙකු සමූපකාර ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ඇති අයෙකු විය යුත්තේය.

සාමාජිකයින්ගේ නිල කාලය

6. (1) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙකුම අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිතාක් හෝ උපරිම වසර තුනක කාලයක් ධුර දැරිය යුතුය.

(2) කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකු ගෙහ් සාමාජිකයින් සියලු දෙනා හෝ ඕනෑම අවස්ථාවක ඉවත් කිරීමට අමාත්‍යවරයාට හැකිය.

(3) යම් සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන් හෝ මිය යාමෙන් හෝ අමාත්‍යවරයා විසින් කලින් ඉවත් කිරීමක් හෝ ඉහත 5(2) උප වගන්තිය පරිදි නුසුදුස්සෙකු වීමෙන් හෝ ඇතිවන පුරප්පාඩුවක් සඳහා නැවත අයෙකු පත්කිරීමට අමාත්‍යවරයාට හැකියාව ඇති අතර එසේ පත්කරනු ලබන සාමාජිකයා හෝ සාමාජිකයින් කලින් සිටි සාමාජිකයා හෝ සාමාජිකයන්ගේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලය සඳහා පමණක් ධුර දැරිය යුත්තේය.

(4) වරක් කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කල අයෙකු නැවත එහි සාමාජිකයෙකු ලෙස පත් කිරීමට හැකිය.

සභාපති හා කොමිෂන් සභාවේ කටයුතු පවත්වාගෙන යාම

7. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින් අතරින් එක් අයෙකු එහි සභාපතිවරයා වශයෙන් නම් කළ යුතුය. සභාපතිවරයා පැමිණ සිටින සෑම අවස්ථාවකදීම ඔහු කොමිෂන් සභා රැස්වීම් වල මූලසුන දැරිය යුතුය. සභාපතිවරයා නොපැමිණි විටදී පැමිණ සිටින සාමාජිකයින් අතරින් තෝරා ගනු ලබන එක් අයෙකු විසින් රැස්වීමේ මූලසුන ගත හැකිය.

(2) කොමිෂන් සභා රැස්වීම්වල ගණ පූර්ණය සඳහා එහි සාමාජිකයින් දෙදෙනෙකු පැමිණ සිටීම ප්‍රමාණවත් වේ.

(3) සාමාජිකයින් දෙදෙනෙකු පමණක් පැමිණ සිටින අවස්ථාවකදී යම් කරුණක් පිළිබඳව තීරණයක් ගත නොහැකි වූ විටක ඒ කරුණ කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනාම පැමිණ සිටින රැස්වීමකට ඉදිරිපත් කළ යුතුය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනාම පැමිණ සිටින රැස්වීමකදී යම් කරුණක් පිළිබඳව ගත යුතු තීරණය සම්බන්ධයෙන් ඒ සාමාජිකයින් අතර වන මතය වෙනස් වන්නේ නම් වැඩි දෙනාගේ මතයට අනුව තීරණයකට එළඹිය යුතුය. එහෙත් සාමාජිකයින් සමානව බෙදුනහොත් සභාපතිවරයාට තීරක ඡන්දයක් හිමිවේ.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයින් අතර පුරප්පාඩුවක් පැවතීම නිසා හෝ පත්කිරීම සම්බන්ධයෙන් වන අඩුපාඩුවක් නිසා හෝ ඒ කරුණ හේතු කොට ගෙන කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ හෝ කරනු ලබන නියෝග හා විධිවිධාන කිසිවක් අවලංගු නොවිය යුතුය. නැතහොත් අවලංගු වන්නා සේ නොසැලකිය යුත්තේය.

(6) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කළ හැකිය.

8. ඌව පළාතේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව කොමිෂන් සභාවේ සභාපතිට සහ එහි සාමාජිකයින්ට ගෙවිය යුතු පාරිශ්‍රමික සහ දීමනා අමාත්‍යවරයා විසින් නියම කල යුතු වන්නේය. සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවීම

9. (1) කොමිෂන් සභාවට ලේකම්වරයෙකු සිටිය යුතු අතර, ඔහු හෝ ඇය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 11 පංතියට නොඅඩු ජ්‍යෙෂ්ඨතාවයක් ඇති නිලධාරියෙකු විය යුතුය. ලේකම් හා අන්‍ය නිලධාරීන්

(2) කොමිෂන් සභාවේ සෙසු කාර්ය මණ්ඩලය පළාත් රාජ්‍ය සේවකයින් අතරෙන් පත්කර ගත යුතුය.

10. (1) කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයින් ලෙස පත්කරනු ලැබූ තැනැත්තන් විසින් ස්වකීය ධූරයේ කාර්යයන් ආරම්භ කිරීමට මත්තෙන් ඌව පළාතේ මහාධිකරණයක විනිශ්චයකාරවරයෙකු ඉදිරියේ මෙම ප්‍රඥප්තියේ සඳහන් උපලේඛන අංක 01 ප්‍රකාරව දිවුරුම් හෝ ප්‍රතිඥා දිය යුතුය. කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ නිලධාරීන්ගේ නිල දිවුරුම්

(2) ලේකම් හා කාර්ය මණ්ඩලයේ සෙසු නිලධාරීන් කොමිෂන් සභාවේ සභාපතිවරයා ඉදිරියේ මෙම ප්‍රඥප්තියේ සඳහන් උපලේඛන අංක 02 ප්‍රකාරව දිවුරුම් හෝ ප්‍රතිඥා දිය යුතුය.

11. කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතුය. කොමිෂන් සභාවේ බලතල

(1) සමූපකාර සමිති වල සියලුම සේවකයින් බඳවා ගැනීම හා උසස් කිරීමට අදාල සේවා කොන්දේසි හා මූලධර්ම ඇතුලත් කාර්ය පරිපාටි නියම කිරීම.

(2) අවශ්‍ය විටක සමූපකාර සමිති සේවකයින් බඳවා ගැනීමට අදාල විභාග පැවැත්වීම හා එබඳු විභාග පැවැත්වීමේ මණ්ඩල නම් කිරීම හා එබඳු විභාග සඳහා වන ගාස්තු නියම කිරීම.

(3) සමූපකාර සමිතියක ඕනෑම තනතුරකට පත් කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම් නියම කිරීම ඕනෑම පන්තියක හෝ ශ්‍රේණියක තනතුරකට හෝ තනතුරුවලට අදාල වැටුප් ක්‍රම නියම කිරීම කලින් කලට එසේ නියම කළ වැටුප් ක්‍රම සංශෝධනය කිරීම, එමෙන්ම කොමසාරිස්වරයා විමසා එබඳු කරුණු පිළිබඳව තීරණය කිරීම.

(4) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන වැටුප් ක්‍රම අනුව වැටුප් ගෙවන ලෙසට සමූපකාර සමිති වලට නියම කිරීම.

(5) සමූපකාර සමිති විසින් සිය සේවකයන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේදී අනුගමනය කල යුතු කාර්ය පරිපාටි නිශ්චය කිරීම, ඒවා පැවැත්වීම සඳහා බලතල නියම කිරීම හා නියම කරනු ලබන කාල සීමාවන් ඇතුලත දී විනය පරීක්ෂණයක් පවත්වා අවසන් කරන ලෙස සමිති වලට දැනුම් දීම.

(6) ඕනෑම සමූපකාර සමිතියක් විසින් ගනු ලබන විනයානුකූල නියමයන් හේතු කොට ගෙන පැන නගින අභියාචනා විභාග කිරීම.

(7) සිය සේවකයන් පිළිබඳව සමූපකාර සමිතිය විසින් තබා ගත යුතු වාර්තා කවරේදැයි නියම කිරීම.

(8) ඕනෑම සේවකයෙකු පිළිබඳව කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි ලිපි ගොනු වෙනත් ලේඛන හා විස්තර වාර්තා නියමිත දිනකට කලින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස සහ සපයන ලෙස ඕනෑම සමිතියකට නියම කිරීම.

(9) කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා නිර්දේශ සහිතව කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට අභියාචනා පරීක්ෂණ නිලධාරි හෝ නිලධාරි මණ්ඩල පත් කිරීම.

(10) තමාගේ ක්‍රියා කලාපය විනය පරීක්ෂණ විෂය කාරණයක්ව පවතින යම් සමිතියක ඕනෑම සේවකයෙකු විසින් එම සමිතිය දුන් විනය නියෝගයට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනා කොට ඇති අවස්ථාවක එවැනි අභියාචනයක් සලකා බලා සමිතිය විසින් කරන ලද තීරණය වෙනස් කිරීමට, ලිහිල් කිරීමට, අවලංගු කිරීමට හෝ ඒ වෙනුවට වෙනත් තීරනයක් ලබාදීමට හෝ නැවත පරීක්ෂණයක් පවත්වන ලෙස නියෝග කිරීමට හෝ එවැනි සේවකයෙකු නැවත සේවයට ගැනීම ඇතුළුව කොමිෂන් සභාව විසින් දෙනු ලබන

නියෝග හා ඒවායේ සඳහන් වන ආකාරයට හා දිනකදී නැතහොත් නියම කරනු ලබන දිනකට පූර්වයෙන් ක්‍රියාත්මක කරන ලෙසට සමූපකාර සමිතියකට නියෝග කිරීම.

(11) විනය කාර්යයක් නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ සේවකයෙකුගේ සේවය අවසන් කිරීමක දී අවශ්‍ය වන්නේ නම් පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ සේවකයින්ට ලබාදීම පිළිබඳව ප්‍රතිපත්ති තීරණය කිරීම.

(12) අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි මගින් නියම කරනු ලබන යම් මුදලක් තැන්පත් කරන ලෙස අභියාචනාකරුට නියම කිරීමට සහ අභියාචනා පරීක්ෂණය අවසානයේදී එකී තැන්පත් මුදල රඳවා ගැනීමට හෝ ආපසු ගෙවීමට තීරණය කිරීම.

(13) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමේදී යම් සමූපකාර සමිතියක් හෝ යම් පන්තියක සමූපකාර සමිති නිදහස් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් විමසා ඇමතිවරයාට උපදෙස් දීම.

(14) පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ගැසට් පත්‍රයෙහි පලකරනු ලබන ආඥාවකින් කොමිෂන් සභාව වෙත පරවනු ලැබිය හැකි සමූපකාර සමිතිවලට හා ඒවායේ සේවකයින්ට අදාල වෙනත් බලතල ක්‍රියාවෙහි යෙදවීම.

(15) ඉහත (6) සහ (12) යන උපවගන්තිවලින් කොමිෂන් සභාව වෙත පැවරෙන බලතල ක්‍රියාවෙහි යෙදීමේදී කොමිෂන් සභාව විසින් කරන ලද යම් තීරණ වල හෝ නියෝග කිරීම් වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට කොමිෂන් සභාවට කල හැකිය.

මූල්‍ය ප්‍රතිපාදන

12. සමූපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන පළාත් සභාව විසින් වාර්ෂිකව වෙන් කර දිය යුතුය.

අරමුදලක් පිහිටුවීම

13. (1) අභියාචනාකරුවන්ගේ තැන්පත් මුදලින් අරමුදලක් පිහිටු විය හැකිය. මෙකී අරමුදලට ඉහත 11 වගන්තියේ (12) උප වගන්තියේ සඳහන් තැන්පත් මුදල් බැර කල හැකිය. මෙම අරමුදලේ කළමනාකාරිත්වය කොමිෂන් සභාව සතුය.

(2) මෙම අරමුදල පාලනය කිරීම සඳහා කාරක රීති සකස් කර ඇමතිවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය.

## II කොටස

## සමූපකාර සමිති හා ඒවායේ කාර්ය මණ්ඩලය

සමූපකාර සමිතියක් සේවා යෝජකයෙකු විය යුතු බව

14. යම් සේවකයෙකු වෙනුවෙන් වැටුප් හෝ වෙනත් පඩිනඩි ගෙවනු ලබන සමූපකාර සමිතියක් එම සේවකයාගේ සේවා යෝජකයා ලෙස සලකනු ලැබිය යුතුය.

සමූපකාර සමිති සේවකයින්ගේ වැටුප්

15. සෑම සමූපකාර සමිතියක්ම එහි අරමුදලින් එම සමිතියේ සේවකයින්ගේ වැටුප් හා අනිකුත් දීමනා ගෙවිය යුතුය.

සමූපකාර සමිති හා ඒවායේ සේවකයින් කොමිෂන් සභාවේ නියෝගයන්ට යටත් විය යුතු බව

16. ඕනෑම සමූපකාර සමිතියක් හා ඒ සමිතියේ කවර සේවකයෙකු වුවද, මෙම ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි නියෝගයන්ට යටත් විය යුතු අතර, මෙ 'ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාවේ බලතල ඉටු කිරීමෙහි හා ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා කෙරෙන කොමිෂන් සභාවේ සියලු නියෝගයන් හා 11 වගන්තියේ (15) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව කරනු ලබන නියමයන් අවසානාත්මක විය යුතු අතර, එකී සමූපකාර සමිති හා ඒවායේ සේවකයන් ඒ නියමයන් පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

කොමිෂන් සභාවේ නියෝග වලින් සමූපකාර සේවයකින් බැඳෙන බව

17. යම් සමූපකාර සමිතියක යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරනු ලබන සියලු නියෝග 11 වගන්තියේ (15) උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව අවසානාත්මක වියයුතු අතර, ඒ නියෝග සමිතිය විසින් කරන ලද්දක් පරිද්දෙන් ඒ සේවකයා විසින් පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට හා ඊට පෙර කරන ලද ක්‍රියාවන් වලංගු කිරීම

18. මෙම ප්‍රඥප්තිය යටතේ ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවන දිනට හෝ ඊට පෙර 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනත හා එයට කරන ලද සංශෝධන අනුව ප්‍රතිස්ථාපිත සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනත අනුව ඌව පළාත් සමූපකාර විෂය භාර අමාත්‍යවරයා සහ ඔහු විසින් පත් කරනු ලැබූ පළාත් සමූපකාර කොමිෂන් සභාව විසින් ද, ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද 1991 අංක 05 දරන ඌව පළාත් සමූපකාර සමිති සහ සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය හා ඊට අදාල සංශෝධන යටතේ ස්ථාපිත කරන ලද ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් ද, ඌව පළාත් සමූපකාර සමිති හා සේවකයින් විෂයෙහි ක්‍රියාත්මක වන පරිදි -

(1) නිශ්චය කරන ලද වැටුප් ක්‍රම හා සේවා කොන්දේසි ඇතුලු සියලු වර්ග කිරීම්,
(2) 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනතේ කාර්යයන් ඉටු කිරීමෙහිලා නිකුත් කරන ලද සියලු ආකාරයේ විධානයන්,
(3) භාරගන්නා ලද සියලු ආකාරයේ අභියාචනා, විභාග කිරීම ආරම්භ කරන ලද හා විභාග නිම කොට නියෝග නිකුත් කල සියලු අභියාචනා,
(4) පනවන ලද සියලු රෙගුලාසි සහ නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධානයන් සහ
(5) කරන ලද සියලුම පත් කිරීම් හා උසස් කිරීම්.

මෙම ප්‍රඥප්තිය යටතේ සිදුකරනු ලැබූ පරිද්දෙන් නීතිමය බලය සහිතව වලංගුව බලපැවැත්විය යුතුය.

පදිංචිය පිළිබඳ සුදුසුකම්

19. සමූපකාර සමිතියක ඕනෑම තනතුරක් සඳහා බඳවා ගත හැක්කේ ඌව පළාත ඇතුළත වසර 2කට වැඩි ස්ථිර පදිංචියක් ඇති තැනැත්තෙකු පමණි. එසේ වුවද කොමිෂන් සභාවේ මතය අනුව යම් සමූපකාර සමිතියක එවැනි තනතුරක් සඳහා සුදුසුකම් ඇති අයෙකු ඌව පළාත ඇතුළතින් තෝරා ගැනීමට අපහසු වුවහොත් අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි වල සඳහන් නියමයන්ට යටත්ව සමිතිය විසින් එකී කොමිෂන් සභාවට දැන්වීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ අනුමැතිය මත එම පළාත තුළ ස්ථිර පදිංචිය නොමැති වුවද සුදුසුකම් ඇති අයෙකු පත්කර ගැනීමට සමූපකාර සමිතියකට බලය තිබිය යුතුය.

සමූපකාර සමිතියක වර්ගය අනුව සහ සේවකයින්ගේ වර්ගය හා පන්තිය අනුව සේවක වැටුප් ක්‍රම නිශ්චය කල යුතු බව.

20. සමූපකාර සමිතියක යම් තනතුරකට පත් කරනු ලබන ඕනෑම තැනැත්තෙකු එම තනතුරට අදාල වූ වැටුප් ක්‍රමයක පිහිටු විය යුතුය. එය 25(1) උප වගන්තියේ සඳහන් ආකාරයට සමිතියේ වර්ගයට අනුව නිශ්ඨය කරනු ලබන සේවක වර්ගයට සහ පන්තියට අදාල පරිදි තීරණය විය යුතුය.

ඌව පළාත් රාජ්‍ය සේවයෙන් ද්වීතියනය කිරීම

21. මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වල කුමක් සඳහන් වුවද පත් කිරීමේ බලධරයාගේ එකඟත්වය සහ අදාල නිලධාරියාගේ ද සමිතියේ ද කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවයෙන් ද්වීතියනය කරන ලද නිලධාරියෙකු සමිතියක යම් තනතුරකට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාල සීමාවකට නියමයන්ට හා කොන්දේසි වලට යටත්ව පත් කිරීමට කොමිෂන් සභාවට හැකිය. මෙම වගන්තියේ කාර්යයන් සඳහා පත් කිරීමේ බලධාරියා යනුවෙන් අදහස් කරනුයේ ඌව පළාතේ රාජ්‍ය සේවයේ පත් කිරීම් බලධාරියා වේ.

සමූපකාර සේවකයින් සේවයෙන් පහ කිරීම සහ දඬුවම් කිරීම

22. (1) යම් සමූපකාර සමිතියක් විසින් තම සේවකයෙකු සේවයෙන් පහකිරීමට හෝ අන්‍යාකාරයක දඬුවමක් කිරීමට මෙම ප්‍රඥප්තිය යටතේ සලසා ඇති ආකාරයට හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසිවලට අනුව මිස නොකල යුතුය.

(2) මේ වගන්තියේ සඳහන් විධිවිධාන කිසිවකින් මෙම කොමිෂන් සභාව සංස්ථාපනය කිරීමේ දිනයට පෙර සිදුවූ නැතහොත් උද්ගත වූ යම් විෂමාචාරයක් හෝ විනය කඩ කිරීමක් හෝ වෙනත් පැමිණිලි නිමිත්තක් හෝ සම්බන්ධයෙන් යම් සමූපකාර සමිතියක සේවකයෙකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීම මෙම ප්‍රඥප්තියේ විධිවිධාන අනුව පවත්වාගෙන යාමට හා අවසන් කිරීමට බාධාවක් නොතිබිය යුතුය.

(3) කිසියම් සමූපකාර සමිතියක් විසින් විධිමත් පරිදි විනයානුකූලව කටයුතු කිරීමකින් තොරව කිසියම් සේවකයකුට දඬුවම් නියම කිරීමට එරෙහිව එම සේවකයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයකදී හෝ ඊට සම්බන්ධ නීති කෘත්‍යක දී සේවකයාට වන්දි, හිඟ වැටුප්, දඬ මුදල් හෝ වෙනත් මුදලක් සමිතියෙන් ගෙවීමට සිදු වුවහොත් එම දඬුවම නියම කිරීමේ තීරණය ගනු ලැබූ කාරක සභාවේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් විසින් තනි තනිව හෝ එකමුතුව එකී මුදල සමිතියට ප්‍රතිපූරනය කිරීමේ වගකීමක බැඳී සිටිය යුතුය. මෙම මුදල් ඌව පළාත් සමූපකාර සමිති ප්‍රඥප්තිය අනුව අයකර ගත හැකිය.

සේවකයින්ට අදාළ රෙගුලාසි

23. (1) පහත සඳහන් ආකාරයේ එනම්,

(අ) සමූපකාර සමිතිවල සේවකයින් වර්ග කිරීම්, ශ්‍රේණි හා පන්ති නියම කිරීම්, බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, ඉල්ලා අස්වීම් සහ සේවය අවසන් කිරීම පිළිබඳව,

(ආ) සේවකයින්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කරමින් හා සේවකයින්ට වැටුප් ක්‍රම, දීමනා හා පාරිතෝෂික ගෙවීම් අත්තිකාරම් ප්‍රදානයක්, නිවාඩු, විනය ක්‍රියාවලිය හා අභියාචනා පිළිබඳ සහ සේවා නියමයන් හා කොන්දේසිවලට අදාළ හා,

(ඇ) අවශ්‍ය වෙතැයි සැලකෙන වෙනත් කරුණු පිළිබඳව.

අමාත්‍යවරයා විසින් රෙගුලාසි සාදනු ලැබිය හැක.

(2) ඌව පළාත් සභා බල සීමාව තුල පිහිටි සියලුම සමූපකාර සමිති සහ ඒවායේ සේවකයින් මෙහි (1) වැනි උප වගන්තියේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් පනවනු ලබන සෑම රෙගුලාසියකින්ම බැඳී සිටිය යුතුය.

සිය සේවකයින් සම්බන්ධ සමූපකාර සමිතිවල කාර්ය භාරයන්

24. (1) සෑම සමූපකාර සමිතියක් විසින්ම -

(අ) එහි සෑම සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ලේඛන හා වාර්තා තබා ගත යුතු අතර, එක් එක් සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ආකාරයට අදාල අවශ්‍ය සියලුම විස්තර ඒවායෙහි ඇතුලත් කළ යුතුය.

(ආ) කොමිෂන් සභාව විසින් සේවකයින් පිළිබඳව සැපයිය යුතු යැයි නියම කරනු ලැබිය හැකි වාර්තා හා තොරතුරු සහ විටින් විට කොමිෂන් සභාවට අවශ්‍ය වෙතැයි නියම කරනු ලැබිය හැකි ආකාරයට තොරතුරු සැපයිය යුතුය.

(ඇ) එම සමිතිවල කාර්යාලවලින් යම් කාර්යාලයකට ඇතුළු වී, එහි පවත්වාගෙන යනු ලබන පොත්පත් ගිණුම් වාර්තා හා ලිපිලේඛණ පරික්ෂා කර බැලීමට හා ඒවායේ පිටපත් ලබා ගැනීමට ද ඒ සඳහා බලය පවරනු ලැබූ කොමිෂන් සභාවේ සාමාජිකයෙකුට හෝ නිලධාරියෙකුට ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් ගේ පූර්ව අනුමැතිය ඇතිව ද, සමූපකාර සංවර්ධන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුට ඌව පලාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව ද එසේ කිරීමට ද ඉඩ දිය යුතුය.

## III කොටස

### කොමසාරිස්වරයාගේ බලතල

කොමසාරිස්වරයා විසින් සමිති වර්ග කල යුතු බව හා කාර්ය මණ්ඩලය නිශ්චය කළ යුතු බව

25. (1) සමූපකාර සමිතිවල සේවක තනතුරු වෙනුවෙන් වැටුප් ක්‍රම නියම කිරීම සඳහා සමූපකාර සමිති වර්ග කිරීමට ද ඒ සමිතිවල සේවක වර්ග හා පන්ති සහ එක් එක් වර්ගයේ හා පන්තියේ සිටිය යුතු සේවකයින්ගේ සංඛ්‍යාව නියම කිරීම හා අවශ්‍ය වෙතැයි තමා සලකන පරිදි විටින් විට වෙනස්කම් කිරීමේ බලය කොමසාරිස්වරයාට තිබිය යුතුය.

(2) ඉහත (1) උපවගන්තිය අනුව කොමසාරිස්වරයා විසින් කරනු ලබන නියමයකට පටහැනි වන පරිදි කිසිම සමූපකාර සමිතියක් විසින් කිසිම තැනැත්තෙකු සේවයට බඳවා ගැනීම නොකළ යුතුය.

සුදුසුකම්, වැටුප් ක්‍රම ආදිය පිළිබඳව කොමිෂන් සභාව කොමසාරිස්ගේ එකඟත්වය ලබා ගත යුතු බව

26. කොමිෂන් සභාව විසින් සමූපකාර සමිතිවල යම් තනතුරකට පත්කිරීමට අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම ද යම් පන්තියක හෝ යම් ශ්‍රේණියක යම් තනතුරකට හෝ තනතුරුවලට අනුයුක්ත කල වැටුප් ක්‍රම නියම කිරීම ද ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධනය කිරීම ද කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව කළ යුතුය.

## IV කොටස

### *විවිධ කරුණු*

27. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී එමගින් විධිවිධාන සලස්වා නොමැති හෝ සාර්ථක විධිවිධාන සලස්වා නොමැති හෝ කැරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් සැකයක් හෝ දුෂ්කරතාවයක් හෝ උද්ගත වුවහොත් අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියෝගයන් මගින් ඒ දුෂ්කරතාවය හෝ සැකය ඉවත් කළ හැකිය. *නැතහොත්* තීරණය කළ හැකිය. එවැනි නියෝගයක් *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසුව ඊට නීතිමය බලය තිබිය යුතු අතරම මෙම ප්‍රඥප්තියේ පනවනු ලැබුවාක් මෙන් වලංගුව හා බලාත්මකව පැවැතිය යුතු ය. — දුෂ්කරතා ඉවත් කිරීම

(2) ස්වකීය කාර්ය පරිපාටි සකස් කර ගැනීම පිළිබඳ ඉහත සඳහන් කරුණුවලින් ආවරණය නොවන්නා වූ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවශ්‍ය වන විධිවිධාන සකස් කර ගැනීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය.

28. (1) ප්‍රකාශිතව අන් ආකාරයක විධිවිධාන සලස්වන ලද්දේ නම් මිස නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය යටතේ බලය පවරා ඇත්තේ හෝ නියම කර ඇත්තේ යම් කරුණු සඳහා හෝ සම්බන්ධයෙන් ඒ සියලු කරුණු සහ නියම කළ යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් ප්‍රකාශකර හෝ නියම කර ඇති සියලු කරුණු සඳහා වූ නියෝග ඇතුලුව මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි ප්‍රතිපත්ති බලගැන්වීම සඳහා අවශ්‍ය වන කොමිෂන් සභාවට පැනවිය හැකි සියලු නියෝග කොමිෂන් සභාව විසින් සෑදිය හැකිය. — අමාත්‍යවරයා විසින් රෙගුලාසි පැනවිය හැකි බව

(2) එවැනි කිසිම නියෝගයක් අමාත්‍යවරයා විසින් එය අනුමත කරනු ලබන තුරු හා ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලබන තුරු බලනොපැවැත්විය යුතුය. එය පළකරනු ලැබූ දිනය හෝ නියෝගයෙහි නිශ්චිත යම් පසු දිනෙක හෝ ක්‍රියාත්මක විය යුතුය.

(3) (1) වැනි උපවගන්තිය යටතේ සාදන ලද නියෝගයක්ම එය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා ඌව පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එම නියෝගය කළ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය. යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන ලද දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතුය.

29. ගන්නා ලද තීරණයක් හෝ කරන ලද හෝ නොකරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාවේ සාමාජික තත්වයෙන් ඒ තැනැත්තාට හෝ නීතිගත සංස්ථා තත්වයෙන් කොමිෂන් සභාවට හෝ විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය. — නෛතික ආරක්ෂාව

30. මෙම ප්‍රඥප්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද යම් සමුපකාර සමිතියක් එහි කාර්යක්ෂමතාවය උදෙසා -

(1) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ගිවිසුම් පදනමින් නිශ්චිත සේවා කොන්දේසිවලට අනුකූලව ප්‍රවීණයකු හෝ විශේෂඥයකු සේවයට බඳවා ගත හැකිය ;

*නැතහොත්*

(2) අනියම් හෝ දවස් පඩි හෝ පැය පඩි ගෙවන සේවකයින් හෝ කැලි ක්‍රමයට ගෙවන සේවකයින් සේවයෙහි යොදවා ගත හැකිය. එසේ වුව ද කොමිෂන් සභාවේ එකඟත්වය නැතිව එවැනි සේවකයින්ට සේවා ස්ථිරත්වයක් ලබා නොදිය යුතුය.

31. (1) (*අ*) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ, — වැරදි

(*ආ*) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් කාර්යයක් ඕනෑකමින් නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ මෙම ප්‍රඥප්තියේ අවශ්‍යතාවයන්ට අනුව කොමිෂන් සභාවට හෝ යථා පරිදි බලය පවරනු ලැබූ අන්‍ය තැනැත්තෙකුට හෝ සපයන ලෙස නියම කරනු ලබන යම් තොරතුරක් සැපයීම ඕනෑකමින්ම නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ,

(*ඇ*) අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරක් ඉදිරිපත් කරන හෝ,

යම් සමුපකාර සමිතියක් හෝ කාරක සභාවක් හෝ යම් නිලධාරයෙකු හෝ යම් සේවකයකු හෝ මම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතුය.

(2) ඉහත (1) වැනි උපවගන්තියේ සඳහන් යම් වරදක් කරන සෑම සමුපකාර සමිතියක් හෝ සෑම තැනැත්තෙකුම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රු. 5,000 කට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(3) සමුපකාර සමිතියක් විසින් මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් කරනු ලැබූ විටක එම සමුපකාර සමිතියේ සෑම නිලධාරියෙක්ම එම වරදට වරදකරු විය යුතුය. තව ද එම වරද සිදු කිරීම වැලැක්වීම පිණිස අවශ්‍ය සියලුම කාර්යයන් තමා කළ බවට හෝ එම වරද තමාගේ අනුදැනුමක් නොමැතිව සිදු කරන ලද බවට හෝ යම් නිලධාරියෙකු විසින් ඔප්පු කළහොත් මිස ඔහු වරදකරු බවට සලකනු ලැබිය යුතුය.

(4) යම් සේවකයෙකු නැවත සේවයේ පිහිටුවන ලෙස හෝ එබඳු ඕනෑම නියෝගයක් හෝ කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ විට එවැනි නියමයන්ට අනුව කටයුතු කිරීම පැහැර හැරීම හේතු කොට ගෙන යම් සමුපකාර සමිතියක් වරදකරු කරනු ලැබූ විටක එවැනි සමුපකාර සමිතියක් -

(අ) 31(2) වැනි උපවගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි දඬුවමකට අතිරේකව වරදකරනු ලැබීමෙන් පසුව එය පැහැර හැරීම ඉදිරිටත් පවත්වාගෙන යන එක් එක් දිනයක් පාසා එක් එක් දිනය වෙනුවෙන් රු. 250ක් බැගින් වූ දඩ මුදලක් ගෙවීමට ද යටත් වන අතර,

(ආ) කොමිෂන් සභාවේ නියමයකට අනුකූලව එසේ සේවකයා නැවත සේවයෙහි පිහිටුවිය යුතු දින සිට අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වන දින දක්වා කාලය ඒ සේවකයාගේ සේවය අවසන් නොකොට දිගටම සේවයෙහි රඳවා සිටියේ යැයි සලකා ඔහුට හිමිවිය යුතු වැටුප් හා වෙනත් දීමනා සියල්ල ගෙවීමට බැඳී සිටිය යුතුය ;

(ඇ) යම් සේවකයකුට වැටුපක් හෝ අන්‍යාකාරයක දීමනාවක් හෝ වන්දියක් හෝ ගෙවන ලෙස කොමිෂන් සභාව නියම කරනු ලැබ ඇති විටක එම ගෙවීම පැහැර හරින ලද යම් සමිතියක් වරකදරු කරනු ලැබූ විට ඉහත (2) වැනි උපවගන්තිය යටතේ නියම කරනු ලැබූ දඬුවමකට අතිරේකව කොමිෂන් සභාව නියම කොට ඇති මුදල ද ගෙවීමට බැඳී සිටිය යුතුය ;

(ඈ) මෙම උපවගන්තියේ (ආ) හා (ඇ) වැනි ඡේද යටතේ සමුපකාර සමිතිය ගෙවීමට යටත්වන මුදල ඒ සමිතිය වරදකරු කරනු ලැබූ උසාවිය විසින් පනවනු ලබන දඩයක ස්වරූපයෙන් එම උසාවියේ ආඥාවක් අනුව අයකරනු ලැබිය හැකිය. ඒ අයකරන මුදල සේවකයාට ගෙවිය යුතුය.

(5) මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යයකදී කොමිෂන් සභාවේ තීරණයක නැතහොත් නියෝගයක නිවැරදිතාවය සලකා බැලීමට පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳ තීරණය කිරීමට යම් මහෙස්ත්‍රාත්වරයෙකුට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය. නැතහොත් නියම නොකළ යුතුය.

කොමිෂන් සභාවට බලපෑම් කිරීම

32. ස්වකීය රාජකාරි ඉටු කිරීමේ දී හැර සෘජුව හෝ වක්‍රව හෝ අන් තැනැත්තෙකුගේ මාර්ගයෙන් හෝ කවර ආකාරයකින් හෝ කොමිෂන් සභාවේ යම් තීරණයක් කෙරෙහි සාමාජිකයෙකුට යම් බලපෑමක් කරනු ලබන හෝ කිරීමට තැත්කරන හෝ සෑම තැනැත්තෙකුම වරදක් කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රු. 5,000 කට නොවැඩි දඩයක් හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට සිර දඬුවමක් යන දෙයාකාරයෙන් එක් ආකාරයක දඬුවමකට හෝ නැතහොත් එකී දඬුවම් දෙකටම යටත් කිරීමට හැකිය.

අනුමැතියක් රහිතව තොරතුරු හෙළිදරව් කිරීම කළ නොහැකි බව

33. කොමිෂන් සභාවේ සාමාජිකයෙකු, එහි ලේකම්, එහි කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හෝ අන්කිසි තැනැත්තෙකු විසින් ස්වකීය නිල කාර්යයන් ඉටු කිරීමේ අවස්ථාවල දී හැර සිය රාජකාරි කටයුතුවල දී තමාට දැන ගන්නට ලැබෙන ලේඛනයක හෝ යම් සංදේශයක හෝ ඇතුළත් යම් තොරතුරක් අනාවරණය කිරීම හෝ ප්‍රකාශ්‍යට පත් කිරීම නොකළ යුතුය.

කොමිෂන් සභාවේ සන්දේශනයක් වරප්‍රසාදවලින් යුක්ත බව

34. කොමිෂන් සභාව හෝ එහි යම් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු සහ යම් සමිතියක් හෝ ඒ සමිතියේ කාරක සභාවේ සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු හෝ සාමාජිකයෙකු අතර, කොමිෂන් සභාවේ නිල කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් හුවමාරු වූ ලිඛිත හෝ වාචික සංදේශනයක අන්තර්ගත යම් කරුණක් යම් නීති කෘත්‍යයක දී හෙළිදරව් කිරීමට හෝ ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවේ සභාපතිවරයා ලියවිල්ලකින් අනුමැතිය දී ඇතොත් විනා කිසිම තැනැත්තෙකුට අවසර නොතිබිය යුතුය.

සමුපකාර සමිති සහ ඒවායේ සේවා නියුක්තයන් සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනත අදාල වීම

35. (1) කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරියක් වෙත යම් සේවා නියුක්තියකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් එම පනතේ 3(ආ) යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇතිනම් එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනය කොමිෂන් සභාව විසින් භාර නොගත යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ යම් සේවා නියුක්තිකයකු විසින් කොමිෂන් සභාවට යම් කරුණක් සම්බන්ධයෙන් යම් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇතිනම් එම කරුණු සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තිකයාට කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට බලයක් නොතිබිය යුතුය.

36. කොමිෂන් සභාවේ සභාපති හා සෑම සාමාජිකයෙකු ද කොමිෂන් සභාවේ සෑම නිලධාරියෙකු හා සේවකයකු ද දණ්ඩ නීති සංග්‍රහයේ පරමාර්ථය හා අර්ථය ඇතුලත රාජ්‍ය සේවකයකු වශයෙන් සැලකිය යුතුය. කොමිෂන් සභාවේ නිලධාරීන් රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුතු බව

37. අල්ලස් පනතේ පරමාර්ථය හා අර්ථය ඇතුලත කොමිෂන් සභාව එම පනත යටතේ උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතුය. අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් විය යුතු බව

38. මෙම ප්‍රඥප්තිය බලාත්මක වීමත් සමග පහත සඳහන් ප්‍රඥප්ති ක්‍රියාත්මක වීම පරිච්ඡින්න විය යුතුය :- ප්‍රඥප්ති අවලංගු කිරීම

*(අ)* ඌව පළාත් සභාවේ 1991 අංක 5 දරන සමුපකාර සමිති හා සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය

*(ආ)* ඌව පළාත් සභාවේ 1992 අංක 5 දරන සමුපකාර සමිති හා සමුපකාර සේවක කොමිෂන් සභා සංශෝධන ප්‍රඥප්තිය.

39. මේ ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

40. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි - අර්ථ නිරූපනය

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් ඌව පළාත් ආණ්ඩුකාරවරයා ද,

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා ද,

"කොමසාරිස්" යන්නෙන් ඌව පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් ද,

"සමුපකාර සමිතිය" යන්නෙන් සමුපකාර සමිතිවලට අදාළ නීතිය යටතේ ලියාපදිංචි කරන ලද සමිතියක් ද,

"කාරක සභාව" යන්නෙන් ලියාපදිංචි කළ සමුපකාර සමිතියක කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය භාරකරනු ලැබූ සමිතියේ පාලක මණ්ඩල අදහස් වන අතර, ලියාපදිංචි කළ සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය හා කොමසාරිස්වරයා විසින් පත් කරන ලද තැනැත්තන් ද,

"නිලධාරියා" යන්නෙන් යම් සමුපකාර සමිතියක් සම්බන්ධයෙන් සඳහන් කෙරෙන සෑම අවස්ථාවක දීම එම පදයෙන් සමුපකාර සමිතියක කාරක සභිකයන් ලේකම් හා සංවිධායක නිලධාරීන් ද,

"සේවකයා" යන්නෙන් සමුපකාර සමිතියක පත්වීමක් ලැබ වැටුප් හෝ දීමනාවක්, පාරිශ්‍රමිකයක් ලබන හා නිශ්චිත කාර්ය භාරයක් පවරන ලද සේවකයෙකු ද

අදහස් කරනු ලැබේ.

**උපලේඛන අංක 01**

ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති, සාමාජිකයෙකු විසින්, ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 10(1) වැනි වගන්තිය ප්‍රකාර දිවුරුම් දීම/ප්‍රතිඥා දීම

ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික වශයෙන් පත්කරනු ලැබ සිටින........................................................................................................................................................................................................................................වන මම, මා වෙත පැවරී ඇති ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/ සාමාජික ධුරයට අයත් කාර්යයන් හෙයින් හෝ පක්ෂපාතිත්වයෙන් ද, දයාවෙන් ද හෝ ද්වේශයෙන් ද තොරව සම්පූර්ණයෙන් යුක්ති ගරුකව හා සාධාරණව ඉටු කරන බවටත් මගේ නිල කාර්යයන් ඉටු කිරීමේදී ඉහත ධුරයට අයත් කාර්යයන් සම්බන්ධයෙන් වූ කවර කරුණක් පිළිබඳව හෝ සෘජුව නැතහොත් වක්‍රාකාරයෙන් හෝ කුමන පුද්ගලයෙකුට වුවද හෙළිදරව් නොකරන බවටත් අවංකවද ගාම්භීරතා පූර්වකව ද ප්‍රකාශ කොට දිවුරුම් දෙමි/ප්‍රතිඥා දෙමි.

.......................................................................
අත්සන.

20.................... ක් වූ .................................... මස ................................................ දින දී මා ඉදිරිපිට දී දිවුරුම් දෙන ලදී. /ප්‍රතිඥා දෙන ලදී.

.......................................................................
පළාත් බද මහාධිකරණ විනිශ්චයකාර.

**උපලේඛන අංක 02**

ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරියෙකු විසින්, ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 10(2) වගන්තිය ප්‍රකාර කරනු ලබන දිවුරුම/ප්‍රතිඥාව

ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරියෙකු වශයෙන් එකී ධුරයේ කාර්යයන් කිරීමට නියම කරනු ලැබ සිටින ........................................................................................................................................................... වන මම ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරි තනතුරට අයත් කාර්යයන් ඉටු කිරීමේ හැර අන් කවර විටකදී වුවත් එකී තනතුරේ කටයුතු කිරීමේදී මට දැන ගැනීමට ලැබෙන්නාවූ ලේඛනයක, සංදේශයක හෝ තොරතුරක අන්තර්ගත කරුණු සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් හෝ සෘජුව නැතහොත් වක්‍රාකාරයකින් හෝ කුමන පුද්ගලයකුට වුවත්, අනාවරණය නොකරන බවට අවංකව ද, ගාම්භීරතා පූර්වකවද ප්‍රකාශ කොට දිවුරුම් දෙමි. /ප්‍රතිඥාදෙමි.

.......................................................................
අත්සන.

20....................ක් වූ ....................................මස ................................................දින දී මා ඉදිරිපිටදී දිවුරුම් දෙන ලදී. /ප්‍රතිඥා දෙන ලදී.

..........................................................................................
සභාපති,
ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව.

10-729

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.